# අනාත්මතාව හා නෛරාත්ම්‍යතාව පිළිබඳ තුලනාත්මක විග්‍රහයක්

එස්.ජී.පී. විජේසිංහ

In the yogācāra, all existents (dharmas) are grouped according to its own cardinal doctrine of svabhāva - traya or three natures as set forth in the Sandhinirmocana - Sutra. Here, all uncaused entities (asamskrta dharmas) -with the exception of s´ūnyata- are counted as ascribed entities (parikalpita), and these do not exist self-subsistently (svalaksana asuddha). All cased entities or originates (samskrta dharmas) are counted as dependent entities (paratantra), and these are accepted as self - subsistently existent (svalaksana siddha). S´ūnyata, which is an asamskrta dharma and signifies the two emptinesses of individuals and things (pudgala and dharma nairātmya), is counted as a final nature (parinispanna). In the Yogacara system, s´ūnyata¯ is the single asamskrta dharma exempted from being classified as an ascribed entity (parikalpita), and it alone among asamskrta dharmas is accepted as self - subsistently existent.

මෙහි නෛරාත්ම්‍ය යනු ආත්මයකින් තොර හිස් යන තේරුමයි. අනාත්ම යන අර්ථය වඩාත් පරිපූර්ණාකාරයෙන් දක්වීමෙහිදී නෛරාත්ම්‍ය යන වචනය මහායාන ග්‍රන්ථයන්හි යොදා තිබෙනු පෙනෙයි. මේ අනුව මෙහි නෛරාත්ම්‍ය යනු හුදෙක් ආත්මයකින් තොර යන තේරුම ඉක්මවා යමින් ආත්මයකින් පමණක් නොව ආත්මය යැයි ගත හැකි කවරාකාර හෝ ස්වරූපයකින් ස්වභාවයකින් පවා තොර යන තේරුම ගෙනදෙයි. එහෙයින් නෛරාත්ම්‍ය යන්නෙහි වඩා වැටහෙන අර්ථය නම් සර්වාකාර වූ ආත්මශූන්‍යතාවයි. මාධ්‍යමික ශූන්‍යතාවාදීහු ස්ව -භාව යැයි ගතහැකි කිසිවක් නැතැයි පැවසීමෙන් සර්වශූන්‍යතාවක් පෙන්වූවද යෝගාචාර විඥානවාදීහු එකී අදහසම වඩාත් පුළුල් අර්ථ නිරූපණයකින් පෙන්වීම සඳහා නෛරාත්ම්‍යය දෙයාකාරයකින් පෙන්වති.

## i. පුද්ගල - ධර්ම නෛරාත්ම්‍යය.

පවත්නා සත්තාව, එනම් ඇත, පවතී, තිබේ යැයි හැඟෙන, දනෙන, විඳින, සිතන, ව්‍යවහාරික දෘශ්‍යමාන මේ ලෝකය ආත්ම, සත්ව, පුද්ගල යන ව්‍යවහාරයන් මගින් නිර්වචනය කිරීමට යාම නිසා විවිධ බෞද්ධ දර්ශන සම්ප්‍රදායන්හි විශේෂයෙන්ම හීනයානික යැයි සම්මත බෞද්ධ සම්ප්‍රදායන්හි පුද්ගල නාමීකරණය අඩු වැඩි වශයෙන් දක්නට ලැබේ.